# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2181/25 - 2020 ජූනි මස 26 වැනි සිකුරාදා - 2020.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1979 අංක 23 දරන ශ්‍රී ලංකාවේ මහවැලි අධිකාරි පනත**

3 වන වගන්තිය යටතේ නියමය

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය චමල් රාජපක්ෂ වන මම 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරී පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ඇතිව මෙහි උපලේඛනයේ දක්වා ඇති මොරගහකන්ද කළුගඟ මහවැලි එෆ් (F) කලාපය කාබනික කෘෂිකාර්මික නිෂ්පාදනයන් සිදු කරන තිරසර සංවර්ධන කලාපයක් ලෙස එම පනතේ කාර්යයන් සඳහාත් පහත සඳහන් අරමුණු හා කාර්යයන් සපුරාගැනීම සඳහාත් මෙයින් ප්‍රකාශයට පත් කරමි.

*අරමුණු හා කාර්යයන් :-*

(අ) කාබනික හරිත කලාප ලෙස මෙම ප්‍රදේශයේ කෘෂි රසායනික, කෘමිනාශක වලින් තොර කාබනික එළවළු, පලතුරු හා අතිරේක බෝග වගාව ප්‍රවර්ධනය.

(ආ) ගල්වැටි, ජෛව වැටි ආදී පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා කිරීම තුලින් තිරසාර පාංශු භාවිතය තහවුරු කිරීම.

(ඇ) කලාපය තුල වාරි ජලය සංරක්ෂණය කිරීම හා ජලය කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා ජල සංරක්ෂණ වගා ක්‍රම ප්‍රවර්ධනය කිරීම.

(ඈ) මෙම කලාපයේ ජීවත්වන ගොවි පවුල්වල ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහාත් කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහාත් බෝග වගාව හා ඒකාබද්ධව කුකුළු පාලනය, කිරිගව පාලනය, එළුගව පාලනය හා තෘණ වගාව ඇතුළත් සමෝධාන ගොවිපල ක්‍රමය ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මෙම කලාපය තුළ බෝග වගාවට අවශ්‍ය කාබනික පොහොර කලාපය තුලම නිෂ්පාදනය කිරීමට අපේක්ෂිතය. එම අවස්ථාව වන තෙක් අවශ්‍ය කාබනික පොහොර ප්‍රමාණයන් සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කරමින් රජය විසින් ගොවීන්ට සපයනු ලැබේ.


1A - PG 5027 — 267 (2020/06)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඊ) මෙම කලාපයේ කාබනික නිෂ්පාදන සහතික කර සෘජු නිෂ්පාදන මෙන්ම අගය එකතු කළ නිෂ්පාදන ලෙස දේශීය හා විදේශීය වෙළඳපොල වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කිරීම.

(උ) එම නිෂ්පාදන " මහවැලි නකල්ස් කාබනික නිෂ්පාදන"සන්නාමයෙන් දේශීය හා විදේශීය වෙළඳපොල වෙත ඉදිරිපත් කිරීම.

(ඌ) මෙම ගොවි පවුල්වල ගෙවතුවල දේශීය එළවළු හා ඌන භාවිත පලතුරු බෝග ප්‍රවර්ධනය කිරීම තුලින් එම බෝග අභාවයට පත් නොවී සංරක්ෂණය කිරීම හා මී මැසි පාලනය ප්‍රවර්ධනය කිරීම.

(එ) කාබනික වගාවේ පලිබෝධ පාලනය සඳහා කෘෂි රසායන වලින් තොර ඒකාබද්ධ පලිබෝධ පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම.

(ඒ) මෙම කලාපය තුළ පලිබෝධනාශක, කෘමිනාශක, වල්නාශක අලෙවිසැල් පවත්වාගෙන යාමට අවසර ලබාදෙනු නොලැබේ.

(ඔ) මෙම කාබනික නිෂ්පාදන කලාපය කෘෂි සංචාරක (agro tourism) කලාපයක් ලෙස මෙන්ම කාබනික වගාව පිළිබඳ අධ්‍යාපනය ලබාගත හැකි ආදර්ශ කලාපයක් ලෙස සංවර්ධනය කිරීම.

(ඕ) මෙම කලාපය තුළ ඇති වාරි ජලය විශේෂ අනුමැතියකින් තොරව කිසිදු කාර්මික කටයුත්තක් සඳහා ලබා නොදීම.

(ක) අදාල ගොවි සංවිධාන සඳහා අවශ්‍ය කෘෂිකාර්මික උපදෙස් හා නිර්දේශ ලබා දීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහයෝගය ඇතිව අවශ්‍ය කළමනාකරණ මෙහෙයුම් යාන්ත්‍රණයක් සකස් කිරීම.

**චමල් රාජපක්ෂ,**
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය.

2020 ජුනි මස 16 වැනි දින
අංක 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල,
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

විශේෂ කලාපයේ සීමාවන් මෙසේ දැක්වේ:-

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කළුගඟ ජලාශයේ වම්ඉවුරු ඇල හා දකුණු ඉවුරු ඇල යටතේ පෝෂණය වන තෝරපිටිය වැව යටතේ FC1/BR තෝරපිටිය, FC1/**D4/BR,** තෝරපිටිය FC1/**D5/BR** තෝරපිටිය, FC2/**D5/BR** තෝරපිටිය යන ඇල පද්ධතිය යටතේ සංවර්ධනය වන කුඹුරු ඉඩම් කැබලි 88 හැර නව කෘෂිකාර්මික ඉඩම් ඇතුළත් හෙක්ටයාර් 3600 ගෙන් සමන්විත පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශය.

*උතුරු මායිම-*

ස්ථානීය ඛණ්ඩාංක **74230උ503392නැ, 574279උ503735නැ, 574307උ504016නැ, 574475උ504506නැ, 574542උ504733නැ, 574895උ504975නැ, 575120උ505324නැ, 575308උ505567නැ, 575370උ505774නැ, 575418උ505967නැ, 575348උ506278නැ, 575370උ506503නැ, 575301උ506737නැ, 575223උ506916නැ, 575217උ507144නැ, 575402උ507136නැ, 575499උ507243නැ, 575676උ507364නැ, 575888උ507353නැ, 576116උ507360නැ, 576231උ507377නැ, 576339උ507488නැ, 576497උ507546නැ, 576582උ507684නැ, 576443උ507811නැ, 576434උ507873නැ, 576519උ507926නැ, 576580උ508040නැ, 576694උ508074නැ, 576878උ508103නැ, 577016උ508166නැ, 577043උ508265නැ, 577244උ508315නැ, 577273උ508486නැ, 577351උ508641නැ, 577486උ508748නැ, 577395උ508946නැ** කළුගඟ හමුවන තෙක් ද,

*නැගෙනහිර/දකුණු මායිම-*

උතුරු මායිමේ අවසන් ලක්‍ෂයයේ සිට කළුගඟ දිගේ ස්ථානීය ඛණ්ඩාංක 570483උ507739නැ, හමුවන තෙක් ද, එතැන් සිට ස්ථාණිය ඛණ්ඩාංක 570172උ507855නැ, 569941උ508051නැ, 569843උ508317නැ, 569685උ508660නැ, 569624උ509500නැ හමුවන තෙක් ද එම ලක්ෂ්‍යයේ සිට කළුගඟ ජලාශයේ දකුණු ඉවුරු ඇලෙහි අවසන් ස්ථානය දක්වා ද එතැන් සිට එම ඇල දිගේ කළුගඟ ජලාශයේ සැඳලි වේල්ල හමුවන තෙක් ද එතැන් සිට කළුගඟ ජලාශයේ නැගෙනහිර මායිමේ උපරිම ජල මට්ටම දැක්වෙන සමෝච්ච රේඛාව දිගේ එම ජලාශයේ ප්‍රධාන වේල්ල හමුවන තෙක් ද එතැන් සිට එම වේල්ල දිගේ වම්ඉවුරු ඇල ආරම්භවන ස්ථානය දක්වා ද,

බටහිර මායිම -

නැගෙනහිර හා දකුණු මායිමේ අවසන් ලක්ෂ්‍යයේ සිට වම්ඉවුරු ඇළ දගේ ස්ථාණිය ඛණ්ඩාංක 572606උ 503820නැ හමුවන තෙක් ද, එතැන් සිට ස්ථාණිය ඛණ්ඩාංක 572870උ503878නැ, 573262උ503863නැ, 573286උ503950නැ, 573638උ504147නැ, 573922උ504055නැ, 573824උ503754නැ, 573938උ503393නැ දක්වා ද එතැන් සිට උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා.

07 - 172

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.